

විගණන සේවා කොමිෂන් සභාව

කාර්ය සාධන වාර්තාව

2023.04.10 - 2023.12.31

විගණන සේවා කොමිෂන් සභාව

අංක 35, ඒ ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත, කොළඹ 08.

පෙලගැස්ම

අනු අංකය	කාරණාව	පිටුව
1	හැදින්වීම	2
2	විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්	3
2.1	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ ව්‍යවස්ථාව මගින් හා 2018 අක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්	3
2.2	විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන	4
3	විගණන සේවා කොමිෂන් සභාවේ 2023.04.10 දින සිට 2023.12.31 දක්වා කාර්ය සාධනය	5
3.1	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ ව්‍යවස්ථාව මගින් හා 2018 අක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය	5
3.2	පරිපාලන හා මූල්‍ය ප්‍රගතිය	6 -7
3.3	2023.04.10 සිට 2023.12.31 දක්වා වූ මූල්‍ය වාර්තාව	8 - 9
4	කොමිෂන් සභා රැස්වීම්	10
5	මානව සම්පත් පැතිකඩ	10
6	අනුකූලතා වාර්තාව	11 -18

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

<u>දැක්ම</u>

ජාතික විගණන පනතෙහි නියමයන්ට අනුකූලව
මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ
විශිෂ්ට විගණන සේවයක්

<u>මෙහෙවර</u>

වෘත්තීයමය භාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කරගත්
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය කිරීම තුලින්
රාජ්‍ය සම්පත් පිළිබඳ වගවීම සහතික කිරීම.

<u>අපගේ අගයන්</u>

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංකභාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

2. විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඇ ව්‍යවස්ථාව මගින් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්

I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය

II. අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවාගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම්වලට අදාළ රීති සකස් කිරීම

III. ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම

IV. නීතිය මගින් සළකනු ලබන පරිදි වූ වෙනත් බලතල කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලය

V. කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ පරිදි සකස් කර ගැසට් පත්‍රයේ පළ කිරීම

VI. විගණනය කරනු ලබන ආයතනයක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් වංචාවක්, නොසැළකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක්, දූෂණයක් සිදුවී ඇති බවටත් විශ්වාස කිරීමට සාධාරණ හේතු කොමිෂන් සභාවට එම අවස්ථාවේ එම ඌනතාවලට හෝ පාඩුවට හෝ අදාළ වටිනාකම විගණන සේවා කොමිෂන් සභාව විසින් අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතුකොටගෙන සිදුවූ සෑම ඌනතාවකටම හෝ පාඩුවකටම අදාළ වටිනාකම් අදාළ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත වාර්තා කිරීම.


VII. කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය දීම සඳහා කමිටු පත් කිරීම.

VIII. ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දීම.

IX. පනතේ විධිවිධාන සළසා ඇති කරුණු සඳහා රීති සැකසීම

X. රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණයට අදාළ රීති සකස් කිරීම.

2.2 සංවිධාන සටහන


කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කාර්යාල කාර්ය සහායක/රියදුරු

3. විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය - 2023.04.10 සිට 2023.12.31 දින දක්වා

3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ විධි විධාන හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්හි ප්‍රගතිය

බලතල	ප්‍රගතිය
ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති සකස් කිරීම	➢ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශන ලබා ගැනීමට ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
	➢ කාර්ය පටිපාටික රීති සංග්‍රහය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, එය විගණන සේවා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරමින් පවතී. ➢ ජාතික විගණන පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත්කර අනුමැතිය සඳහා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.


3.2 පරිපාලන හා මූල්‍ය ප්‍රගතිය


2023 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා විගණන සේවා කොමිෂන් සභාව සඳහා පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් 2023.04.10 සිට 2023.12.31 දක්වා වූ කාලය තුල පුනරාවර්තන වියදම් ලෙස රුපියල් 14779545.00 හා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් 17782412.00 ක් වැය කර ඇත.


මූල්‍ය ප්‍රගති සාරාංශය - 2023.04.10 සිට 2023.12.31 දක්වා

	ලැබී ඇති ප්‍රතිපාදන රු.	මුළු වියදම රු.	ඉතිරිය රු.
පුනරාවර්තන	**48,700,000**	**14,779,545**	**33,920,455**
ප්‍රාග්ධන	**19,300,000**	**17,782,412**	**1,517,588**
එකතුව	**68,000,000**	**32,561,957**	**35,438,043**

මූල්‍ය ප්‍රගති සාරාංශය







3.3 2023.04.10 සිට 2023.12.31 දක්වා වූ මුල්‍ය වාර්තාව

පුනරාවර්තන වියදම්

වැය විෂයය	විස්තරය	වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.	වියදම්කළ ප්‍රමාණය රු.	ඉතිරිය රු.	ප්‍රගතිය %
1001	වැටුප් හා වේතන	12,500,000	1,808,916	10,691,084	14%
1002	අතිකාල හා නිවාඩු දින වැටුප්	150,000	17,277	132,724	12%
1003	වෙනත් දීමනා	13,000,000	4,647,618	8,352,382	36%
1101	ගමන් වියදම් දේශීය	100,000		100,000	0%
1102	ගමන් වියදම් විදේශීය			-	
1201	ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,500,000	517,337	982,663	34%
1202	ඉන්ධන	1,500,000	496,765	1,003,235	33%
1203	ආහාරපාන හා නිල ඇඳුම්	300,000	137,469	162,531	46%
1301	වාහන	1,500,000		1,500,000	0%
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	500,000	26,498	473,502	5%
1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	500,000	178,350	321,650	36%
1401	ප්‍රවාහන	3,700,000	1,532,661	2,167,339	41%
1402	තැපැල් හා සන්නිවේදන	1,500,000	352,470	1,147,530	23%
1403	විදුලිය හා ජලය	1,500,000	78,839	1,421,161	5%
1404	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	6,400,000	4,078,800	2,321,200	64%
1406	කල්බදු වාහන සඳහා පොලී ගෙවීම්				
1408	මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා				
1409	වෙනත්	3,600,000	881,308	2,718,692	24%
1505	සම්මාදම් සහ දායක මුදල්				
1506	රජයේ සේවකයන් සඳහා දායක මුදල්	450,000	25,236	424,764	6%
	මුළු පුනරාවර්තන වියදම්වල එකතුව	48,700,000	14,779,545	33,920,455	

**** කාර්ය මණ්ඩල ඌනතාවයක් පැවතීම නිසා පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.**

මූලධන වියදම්					
වැය විෂයය	විස්තරය	වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු.	වියදම්කළ ප්‍රමාණය රු.	ඉතිරිය රු.	ප්‍රගතිය %
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	4,000,000	3,641,239	358,761	91%
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	-	-	-	
2003	වාහන	-	-	-	
2101	වාහන	-	-	-	
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	7,800,000	6,827,443	972,557	88%
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	7,500,000	7,313,730	186,270	98%
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	-			
2105	ඉඩම් සහ ඉදිකිරීම්	-			
2106	මෘදුකාංග සංවර්ධනය	-			
2108	කල්බදු වාහන සඳහා ණය මුදල ආපසු ගෙවීම්	-			
2401	කාර්යමණ්ඩල පුහුණු	-			
	මූලධන වියදම්වල එකතුව	19,300,000	17,782,412	1,517,588	

4. කොමිෂන් සභා රැස්වීම්

2023.04.10 දින සිට 2023.12.31 දක්වා කාලය තුල විගණන සේවා කොමිෂන් සභා රැස්වීම් වාර 20 ක් පවත්වා ඇත.

5. මානව සම්පත් පැතිකඩ

5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

විගණන සේවා කොමිෂන් සභාව සඳහා 2023.12.31 දිනට අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව43 කි.

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව සහ 2023.12.31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු

තනතුරේ ස්වභාවය	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	ලේකම්	01	01	07
	අතිරේක ලේකම්	01	0	
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	01	01	
	අධ්‍යක්ෂ	01	01	
	සහකාර අධ්‍යක්ෂ	01	0	
	සහකාර ලේකම්	02	0	
	ගණකාධිකාරී	01	0	
	අභ්‍යන්තර විගණක	01	0	
	නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත)	01	0	
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	01	04
	භාෂා පරිවර්තක	03	0	
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	01	0	
ද්විතීය මට්ටම	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01	0	15
	කළමනාකරණ සේවා නිලධාරී සේවය	15	01	
ප්‍රාථමික මට්ටම	රියදුරු සේවය	05	0	05
	කාර්යාල සේවක සේවය	07	01	06
එකතුව		43	06	37

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ	අනුකූල වේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ		
1.6	වෙනත්			
2	පොත්පත් ලේඛන නඩත්තු කිරීමෙන් (මූ.රෙ 445)	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)	අනුකූල වේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)	අනුකූල වේ		
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දී තිබීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංගය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම	අනුකූල නොවේ		විගණන සේවා කොමිෂන් සභාව 2023.04.10 දින සිට නැවත ක්‍රියාත්මක වූ අතර 2024 වර්ෂය සඳහා මෙම සියලු සැලැසුම් සකස් කර ඇත.
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල නොවේ		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	විගණන විමසුම්	අනුකූල නොවේ		විගණන සේවා කොමිෂන් සභාව 2023.04.10 දින සිට නැවත ක්‍රියාත්මක වූ අතර 2024 වර්ෂය සඳහා මෙම සියලු සැලැසුම් සකස් කර ඇති අතර, ඒ අනුව කටයුතු සිදු කරනු ලැබේ.
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල නොවේ		
6	අභ්‍යන්තර විගණනය	අනුකූල නොවේ		
6.1	මු.රෙ.134(2) DMA /1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම			
7	විගණන හා කළමණාකරණ කමිටු	අනුකූල නොවේ		
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	අනුකූල නොවේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල නොවේ		මේ වන විට පත්කර ඇත
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ		ගර්හිත භාණ්ඩ නොමැත
9	වාහන කළමනාකරණය			විගණන සේවා කොමිසම සතුව වාහන නොතිබුණි.
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත්කිරීම			
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම			
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙනයාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම			

අංකය	අදාළකර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	බැංකු ගිණුම් කළමනාකරණය	අනුකූල වේ		
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය	අනුකූල වේ		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළබීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම්	අනුකූල වේ		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	අග්‍රිම ගිණුම	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් කර මසක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම	අනුකූල වේ		
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම	අනුකූල වේ		
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම	අනුකූල නොවේ		2023 වර්ෂයේ කාර්ය මණ්ඩලය ඌනතාවයක් පැවති අතර, 2024 සඳහා සැලැසුම් සකස් කර ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර් සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල නොවේ		2023 වර්ෂයේ කාර්ය මණ්ඩලය ඌනතාවයක් පැවති අතර, 2024 සඳහා සැලැසුම් සකස් කර ඇත.
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		